# සී/ස ගාල්ල දිස්ත්‍රික් ස.ණ.ස. සමිති සංගමය

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් / පරිපාලන / සංවර්ධන) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සී/ස ගාල්ල දිස්ත්‍රික් ස.ණ.ස. සමිති සංගමයේ පුරප්පාඩුව පවතින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් / පරිපාලන / සංවර්ධන) තනතුර සඳහා 01 / 2026 දකුණු පලාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ චක්‍රලේඛය අනුව අයදුම්පත් කැඳවනු ලැබේ.

**කේත අංකය - EL - 02** **ශ්‍රේණිය - III ශ්‍රේණිය**

**සුදුසුකම්**

වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍ය / කළමනාකරණ / ගණකාධිකරණ / ව්‍යාපාර සංවර්ධන / ව්‍යාපාර පරිපාලන / මානව සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රයන්ට අදාල උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 03 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබා තිබීම හෝ

උසස් ජාතික තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ගණකාධිකරණ / ව්‍යාපාර මූල්‍ය / ව්‍යාපාර පරිපාලන (HNDBF / HNDA / HNDBA) ඩිප්ලෝමාව / (උපාධියට ගැලපෙන SLQF Level 5 හෝ ඊට ඉහළ) සමත්වීම හා අදාල ක්ෂේත්‍රයේ වසර 5 ක පළපුරුද්ද හෝ

රජයේ පිළිගත් ආයතනයකින් ව්‍යාපාර සංවර්ධන / ව්‍යාපාර පරිපාලන / මානව සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රයන්ට අදාල ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම සහ අදාල ක්ෂේත්‍රය පිළිබඳ වසර 05 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබා තිබීම හෝ

EL 03 මට්ටමේ 1 ශ්‍රේණියේ තනතුරක සේවය කිරීම හෝ EL 03 මට්ටමේ 11 ශ්‍රේණියේ තනතුරක වසර 04 කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

- ➢ පරිගණක පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ

**වැටුප් පරිමාණය - 47,000-1,010 X 5-1,260 X 5 - 1,510 X 10 - 1,760 X 10 - 2,010 X 12 = 115,170/-**

මෙයට අමතරව 01/2026 චක්‍රලේඛයේ සඳහන් විධායක දීමනාව රු. 12,000/- ක් ද, ගෙවනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක කරන අතර, සේවක කොමිෂන් සභා අනුමැතියෙන් පසු සේවක විශ්‍රාම වැටුපටද දායක කරනු ලැබේ. සංගමයේ ගරු අධ්‍යක්ෂක මණ්ඩලයෙන් අනුමත වරප්‍රසාද හා දීමනා වලට ද හිමිකම් කියනු ලැබේ.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.06.30**

**අයදුම්පත් එවිය යුතු ක්‍රමය**

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් සමග සුදුසුකම් සනාථ කිරීමේ සහතිකවල ඡායා පිටපත්, උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත්ද, සේවා සහතික ද එවීම අනිවාර්ය වේ.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය**

**ගරු සභාපති, සී/ස ගාල්ල දිස්ත්‍රික් සණස සමිති සංගමය, "තක්සලා", 153, අබ්දුල් වහබ් මාවත, ගාල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ පැමිණ භාරදිය හැක.

ලියුම් කවරයේ වම් පස ඉහළ **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් / පරිපාලන / සංවර්ධන තනතුර)** ලෙස සඳහන් විය යුතුය.

**2026.06.15**